# පිළිසඳර

2016
ජනවාරි/ පෙබරවාරි
pilisandara.npas@gmail.com

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ අධ්‍යාපන හා තොරතුරු ප්‍රකාශනය
Educational and News Bulletin of The National Photographic Art Soceity of Sri Lanka


## පාඨමාලා සමාරම්භක උළෙල 2016

2016 වසර සඳහා සංගමයට අලුතෙන් එක්වූ සාමාජික හිතමිතුරන් පිළිගැනීමේ සහ ඡායාරූප පාඨමාලාව නිල වශයෙන් ආරම්භ කිරීමේ උත්සවය ජනවාරි 31 වැනි දින පස්වරුවේ මහවැලි කේන්ද්‍රයේ දී පැවැත්විණි. මෙම වර්ෂය සඳහා සංගමයට එක් වූ නවකයින් 250 ක පමණ පිරිසක් මේ සඳහා ආරාධනා ලැබ සිටියහ. ඊට අමතරව සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජික සාමාජිකාවන් සැලකිය යුතු පිරිසක් ද එදින පැමිණ සිටි අතර නවකයින් සඳහා වන තේ පැන් සංග්‍රහය දෙවන වසර විද්‍යාර්ථීන් විසින් සංවිධානය කර තිබිණි.




මෙම පාඨමාලා සමාරම්භක උත්සවයේ ආරාධිත ශාස්ත්‍රීය දේශනය කැලණිය විශ්වවිද්‍යාලයේ ජන සන්නිවේදන අධ්‍යයනාංශයේ මහාචාර්ය ආරියරත්න ඇතුගල මහතා විසින් පවත්වනු ලැබීය. මෙදින පැමිණ සිටි නවකයින් සඳහා කාල සටහන් හා ශිෂ්‍ය අත්පොත් බෙදාදුන් අතර, මෙවර විශේෂයෙන් සකස් කොට ඉදිරිපත් කෙරුණු සාමාජික ප්‍රවර්ධන කට්ටලය ලබාගැනීමට සෑම කෙනෙක් ම පාහේ ඉදිරිපත් වූහ.





# එළඹෙන වසන්තයේ කඳුකරයේ දෙදිනක්

සංගමයේ වාර්ෂික දෙදින චාරිකාව මාර්තු 19,20 යන දිනවල හැටන් නුවරඑළිය යන ප්‍රදේශ ආශ්‍රිතව පැවැත්වීමට පූර්ව සංවිධාන කටයුතු මේ දිනවල සිදුකරමින් තිබේ. කඳුකර ප්‍රදේශ ආශ්‍රිත ඡායාරූපකරණය, සාමාජික සුහදතාව වර්ධනය, සාමාජික කුසලතාවන් හඳුනාගැනීම යන අරමුණු පෙරදැරි කොටගෙන සමාජසේවා හා සුබසාධන අංශය මෙම චාරිකාව සංවිධානය කරයි.

සංවිධාන කටයුතුවල හා නවාතැන් පහසුකම්වල තත්වය මත මෙම චාරිකාව පළමුව ඉදිරිපත් වන සාමාජික හවතුන් සිය දෙනෙකුට පමණක් සීමා කිරීමට සිදුව ඇත. එහෙත් දෙදින චාරිකාවක් බැවින් සාමාජිකාවනට අවශ්‍ය නම් මව හෝ සොයුරියක ද, විවාහක අයට පවුලේ සාමාජිකයන් ද මෙම චාරිකාවට සහභාගි කොටගත හැකි ය.

2016 මාර්තු 18 වන සිකුරාදා රාත්‍රි 10.30 ට (පැය 22.30) පිටකොටුව ගුණසිංහපුර ප්‍රතිමාව අසලින් ගමන් ආරම්භ කෙරේ. නුවරපාර ඔස්සේ පේරාදෙණිය හරහා ගම්පොල, රම්බොඩ දක්වා ගොස් එහි අරුණලු අසිරිය සමග උදේ ආහාරය ලබාගත හැකි ය. යොදා ඇති සැලසුම් පරිදි දිවා කාලය නුවරඑළිය ප්‍රදේශයේ චාරිකා කොට හැටන් නගරයේ රාත්‍රි නවාතැන් ගනු ඇත.

එම රාත්‍රිය අසිරිමත් සාමාජික සම්බන්ධතාවක් උදෙසා වන වැඩසටහන් ගණනාවකින් විචිත්‍රවත් කෙරේ. පංති මට්ටමින් සාමාජිකයින් අතර රංගන, නර්තන හා විකට වැඩසටහන් ද හඳුනාගැනීමේ හමුවක් ද සූදානම් කොට ඇත. චාරිකාව පුරාවට ම සංගමයේ ජ්‍යෙෂ්ඨයින්ගේ මගපෙන්වීම පරිදි වන ඡායාරූපකරණ අභ්‍යාස හා වැඩමුළු ද සංවිධානය කෙරේ. චාරිකාව අවසානයේ චාරිකා ඡායාරූප තරගයක් හා ඡායාරූප දැක්මක් සංවිධානය කෙරෙන අතර ජයග්‍රාහකයනට ත්‍යාග හා සහතික පිරිනැමේ.

සංගමයේ ගෞරවය හා නීතිරීති සුරකමින් මෙම සහෘද චාරිකාවට එක්වන මෙන් ඔබට මෙයින් ඇරයුම් කෙරේ. පිඟානක්, කෝප්පයක් සීතලට ඇඳුම් ඔබ විසින් රැගෙන ආ යුතු ය. මෙහි පිරිවැය රු. 3250/= ක් වන අතර 2000/= ක් වන අත්තිකාරම් මුදලක් ගෙවා පෙබරවාරි 15 දිනට පෙර ඔබේ පැමිණීම තහවුරු කළ යුතු වේ. ප්‍රමාද වන හා නියමිත දිනට පැමිණ චාරිකාවට එක්වීමට අදහස් කරන අයට ඒ සඳහා අවස්ථාව නොලැබෙන බව කරුණාවෙන් සලකන්න.

මේ පිළිබඳ වැඩි විස්තර හා විමසීම් සඳහා මතු සඳහන් දුරකථන අංක විවෘත ය.

සමාජසේවා හා සුබසාධන අධ්‍යක්ෂ : අනුර රාජා සිංහබාහු - 077 3734786

චාරිකා සංවිධායක කමිටුව : ශ්‍යාමලී කරුණාපාල - 0715184954, චන්දු ගුණවර්ධන - 0716529423,
එස්. රාම්දාස් - 0776358248

---

# නුවරඑළිය චාරිකාව සඳහා සහභාගි වීමේ ඉල්ලුම් පත්‍රය

1. නම:..........................................................................................................

2. ලිපිනය:......................................................................................................

3. සාමාජික අංකය:........................................ 4. ජාතික හැඳුනුම්පත් අංකය:........................................

5. දුරකථන අංකය:..........................................................................................

6. ඔබ සමග කී දෙනෙකු සහභාගි වන්නේද?..................................

| | නම | ජා.හැ. අංකය | ඥාති සම්බන්ධතාව |
|---|---|---|---|
| 01. | | | |
| 02. | | | |
| 03. | | | |

7. චාරිකාවට එක්වන ස්ථානය:..........................................................................

8. ඔබට අසනීපයක් හෝ ආහාර ගැනීමේ දී අසාද්මිකතාවක් තිබේද?..................................

මෙම චාරිකාව සඳහා යන සම්පූර්ණ මුදල / අත්තිකාරම් මුදල වන රු:.................................... මේ සමග ඉදිරිපත් කරමි.

අත්සන: ....................................................................... දිනය: ..........................................

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහායි.**

ඉහත ........................................................................................................ මහතා/මහත්මිය/මෙනෙවිය විසින් භාරදෙන ලද රු: ................................ ක අත්තිකාරම් / සම්පූර්ණ මුදල ................................................................වන මා විසින් ස්තූති පූර්වකව භාරගතිමි.

අත්සන: ................................................... දිනය: ........................................

## විල්සන් හැගොඩ අනුස්මරණ පින්කම



සංගමයේ ආදි කර්තෘ විල්සන් හැගොඩ සූරීන්ගේ 101 වන ජන්ම දින සැමරුම අළලා ජනවාරි මස 08 වැනි දින තෙල්, මල්, පහන් සහිත අෂ්ටපාන බෝධි පූජාමය පින්කමක් මාදින්නාගොඩ ශ්‍රී සුරම්‍යාරාම විහාරස්ථානයේ දී පැවැත්විණි. ශාස්ත්‍රපති පූජ්‍ය දොඩම්ගොල්ලේ පඤ්ඤානන්ද හිමිපාණන්ගේ මෙහෙයවීමෙන් පැවති මෙම පින්කමට සංගමයේ නිලධාරීන්, සාමාජිකයින්, හැගොඩ පවුලේ ඥාතීන් ඇතුළු පිරිසක් සහභාගි වූහ. අභිනවයෙන් ඉදිකරනු ලබන විහාරස්ථ පුස්තකාලයට පොත්පත් පරිත්‍යාගයක් ද මෙදින සිදු කෙරිණි.

## විල්සන් හැගොඩ සමරු මුද්දරය




*විල්සන් හැගොඩ මහතාගේ සිය වැනි ජන්ම සංවත්සරය වෙනුවෙන් නිකුත් කිරීමට සැලසුම් කර තිබූ මුද්දරය පසුගිය ජනවාරි 11 වැනි දින ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාගේ ප්‍රධානත්වයෙන් ජන ගත කෙරිණි. ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තු ශ්‍රවණාගාරයේ පැවති මෙම උත්සවයට, තැපැල්පති රෝහණ අබේරත්න, ලේඛනාගාර අධ්‍යක්ෂ ආචාර්ය සරෝජා වෙත්තසිංහ, හැගොඩ පවුලේ ඥාතීන්, සංගමයේ පැරණි හා නවක සාමාජික භවතුන්, අගනුවර තරුණ කවි සමාජයේ නිලධාරින් ඇතුළු පිරිසක් සහභාගි වූහ. රු 10 ක වටිනාකමකින් යුතු මෙම මුද්දරය දැන් ඔබට ද දිවයින පුරා තැපැල් කාර්යාල මගින් ලබාගත හැකි ය.*

## අවශ්‍ය, අවශ්‍ය ම, අත්‍යවශ්‍ය ම අයට
## සාමාජිකත්ව ප්‍රවර්ධන තිළිණය..

සංගමයේ සාමාජිකත්වය පුළුල් කරලීමේ වසර ලෙස 2016 වර්ෂය නම්කොට ඇත. ඒ අනුව විශේෂ සාමාජික ප්‍රවර්ධන කට්ටලයක් ද නව සාමාජිකයින් වෙනුවෙන් හඳුන්වා දී ඇත. මේ සඳහා රුපියල් දෙදහසක පිරිවැයක් දැරීමට සිදුව ඇති අතර සාමාජික ඔබට ද මෙම ප්‍රවර්ධන කට්ටලය ලබා ගැනීමට පුළුවන. Feltcitation NPAS, කැමරා සඟරා, ලිපිකවර, පෑන්, සටහන් පොත්, ටී ෂර්ට් ද ඊට ඇතුළත් ය. ඉතිරිව ඇත්තේ ප්‍රවර්ධන කට්ටල ඉතා සීමිත සංඛ්‍යාවක් බැවින් ඉක්මනින් ඉල්ලුම් කරන අයට පමණක් ලබාදිය හැකි ය.

## තොරතුරු එකතුවට ඔබත් එනවා ද ?

සමාජසේවා හා සුබසාධන අංශය මගින් සාමාජික තොරතුරු හා ඡායාරූප ඇතුළත් විශේෂ සමරු කලාපයක් / දත්ත එකතුවක් අප්‍රේල් මස දී නිකුත් කරන්නට විධිවිධාන යොදා ඇත. මෙයට සංගමයේ සෑම සාමාජිකයෙකුගේ ම ඡායාරූපයක් සමග ලිපිනය, ඇමතුම් අංකය ඇතුළු තොරතුරු ඇතුළත් කෙරේ. සාමාජිකයින් අතර අන්‍යෝන්‍ය සුහදතාව හා සම්බන්ධතා තරකරලීම අරමුණු කොටගෙන මෙම දත්ත එකතුව පළකෙරේ. මේ සඳහා ඔබගේ තොරතුරු ද ඇතුළත් කරන්නට නම් පහත සඳහන් කූපනය පුරවා ඡායාරූපයක් ද සමග මාර්තු 15 වැනි දිනට පෙර අධ්‍යක්ෂ සමාජසේවා හා සුබසාධන වෙත ලබාදෙන්න. නොඑසේ නම් සංගමයේ වෙබ් අඩවියෙන් (www.npasslanka.org) මෙය බාගත කොටගෙන අයදුම්පත පුරවා ඡායාරූපය ද සමග gunaratneshantha@gmail.com හෝ td.samarakoon@yahoo.com යන විද්‍යුත් තැපැල් ලිපිනයන් වෙත යොමු කරන්න.

## NPAS Member's Directory - 2016

Membership No. ........................................

Name in full : ........................................................................................................

Postal address : ........................................................................................................

Profession : ........................................................................................................

Designation : ........................................................................................................

Institute / Work Place : ..............................................................................

Tel. No. : ........................................................................................................

E-mail : ........................................................................................................

| Photograph |
|---|
| 45 mm |
| 35 mm |

# මහා සභාවේ වැදගත් කරුණු.

2016/16 නිල වර්ෂයේ වසර මැද මහා සභා රැස්වීම ජනවාරි 24 වැනි ඉරු දින පෙරවරුවේ කොළඹ මහවැලි කේන්ද්‍රයේ දී පැවැත්විණි. සංගමයේ අභිවෘද්ධිය පතා වන වැදගත් කරුණු රැසක් මෙදින රැස්වීමේ දී ගැඹුරින් සාකච්ඡාවට භාජනය විය.

### සාමාජික සුහදතාව හා අන්තර් සබඳතා වර්ධනය

මෙම අරමුණ ඉලක්ක කොටගෙන සමාජ සේවා හා සුබසාධන අංශය මගින් පැවැත්වීමට කටයුතු යොදා ඇති වාර්ෂික දෙදින චාරිකාවට සහභාගිවීමේ වැදගත්කම මහා සභාවේ දී මනාව පැහැදිලි කෙරිණි. මේ සඳහා පිළිසඳරේ ඇතුළත් තොරතුරුවලට අනුව ඔබේ පැමිණීම මුදල් අත්තිකාරම මගින් පෙබ 15 දිනට පෙර සනාථ කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

අප්‍රේල් මස 24 වන දින මහත් උත්කර්ෂවත් ලෙස සංවිධානය කිරීමට නියමිත සාමාජික සුහද හමුවට ඔබ සහ ඔබගේ පවුලේ අයට ද සෙනෙහසින් ඇරයුම් කරමු. මේ සඳහා සැලකිය යුතු පිරිවැයක් දැරීමට සිදුව ඇතත් එම ආර්ථික භාරය අනුග්‍රාහකයන් මගින් සපයා ගැන්මට සමාජ සේවා අධ්‍යක්ෂතුමන් ඇතුළු අනු කමිටුව දැනට මත් ක්‍රියාත්මක වී හමාර ය. එබැවින් මහත් සහනදායී මුදලකට (ආහාරපාන සඳහ පමණක් සීමා වන) ඔබට මේ සඳහා දායකවන්නට අවකාශ ඇත. මෙම කරුණු ද්විත්වය පිළිබඳ ඔබේ ඇමතුම් සඳහා සමාජ සේවා අධ්‍යක්ෂ අනුර රාජා සිංහබාහු මහතාගේ 077 3734786 දුරකථන අංකය විවෘත ව ඇත.

### මූලස්ථානය ඉදිකිරීමේ කාර්යය.



සංගමයේ ඉතිහාසය පුරා තිබූ අර්බුදකාරී ම ගැටලුවට විසඳුම් පතා මූලස්ථානයක් ඉදිකිරීමේ කාර්යය අද දවසේ සාංගමිකයන්ගේ ප්‍රමුඛතම කටයුත්ත වේ. නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ අනුග්‍රහයෙන් ලබාගත් බිම්කඩෙහි ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා වන දළ පිඹුරුපත, මහා සභා රැස්වීමේ දී ජ්‍යෙෂ්ඨ සාමාජික, වරලත් වාස්තු විද්‍යාඥ සිතුම්ණි රත්නමලල මහතා සභාවට ඉදිරිපත් කළේ ය. මෙම කාර්යයයේ යථා තත්වය, ප්‍රායෝගික ගැටලු, මූල්‍ය ඉලක්ක පිළිබඳ ඒ මහතා දීර්ඝ වශයෙන් කරුණු පැහැදිලි කළේ ය.

මූලස්ථානය ඉදිකිරීමේ අභියෝග හා මූල්‍ය අවශ්‍යතා සම්පූර්ණ කරගැනීමේ විවිධ උපායමාර්ග පිළිබඳව මෙහි දී බොහෝ දෙනා අදහස් දැක්වූහ. එහි දී මතු වූ අදහස් අනුව පහත සඳහන් යෝජනාවලට සභාවේ අනුමැතිය හිමි විය.

1. 2017 වසරේ පටන් ඇතුළත්වීම් ගාස්තුව රු. 1000/= ක් ලෙස සංශෝධනය.
2. හිඟ සාමාජික මුදල් අයකර ගැනීම.
3. නව මූල්‍ය සම්පාදන ව්‍යාපෘති දියත් කිරීම.
4. බාහිර ආයතන/පාර්ශව/ව්‍යාපාර/ දෙස් විදෙස් සංවිධාන වෙතින් අනුග්‍රහය ඉල්ලීම.
5. ගොඩනැගිලි අරමුදල සඳහා රු. 12000/= බැගින් වන මුදලක් පරිත්‍යාග කරන ලෙස සෑම සාමාජිකයෙකුගෙන් ම ඉල්ලා සිටීම.
6. මධ්‍යස්ථාන අරමුදල ගොඩනැංවීම.

හිටපු සභාපති මංගල එදිරිසිංහ මහතා විසින් සභාවට ඉදිරිපත් වූ සියලු අරමුදල් සම්පාදන යෝජනා සලකා බලා, ඒ මහතාගේ අදහසක් පරිදි ඉහත අංක 05 දරන යෝජනාව ඉදිරිපත් කළේ ය. ඒ අනුව සංගමයේ සක්‍රීය සාමාජිකත්වයක් හොබවන පිරිස යම් කැපකිරීමක් සිදුකළහොත් මේ අවශ්‍යතාව සඳහා වඩාත් ප්‍රායෝගික විසඳුමක් සපයාගත හැකි වේ.

යථෝක්ත යෝජනාව ඉන් අනතුරුව මූලස්ථාන ප්‍රතිෂ්ඨාපන කමිටුවේ අවධානයට බඳුන් කරන ලදුව, ඔරොත්තු දෙන ගෙවීම් ක්‍රමවේදයට අනුව සංගමය වෙත එම මුදල ලබා දීමට හැකි වැඩ පිළිවෙළක් යෝජනා විය. ඒ අනුව පහත සඳහන් ගෙවීම් ක්‍රම තුනට යටත්ව රු. 12000/= ක මුදලක් සපයා දීමෙන් ඒ සඳහා මේ මොහොතේ අත්‍යවශ්‍ය ම වන ඔබේ දායකත්වය සංගමය වෙත ලබා දෙන ලෙස මහත් කාරුණික ව ඉල්ලා සිටිමු. මේ සඳහා වන ඔබේ පරිත්‍යාගය ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ප්‍රධාන ශාඛාවේ **100010100838** අංක දරණ **ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ ගොඩනැගිලි අරමුදල් ගිණුමට** බැර කළ හැකි ය.

**ගෙවීම් ක්‍රමවේද**

1. එකවර රු. 12000/= ක මුදල පරිත්‍යාග කිරීම.
2. 2016 දෙසැ 31 දිනට පෙර රු. 6000/= ක මුදලක් සහ 2017 දෙසැ 31 ට පෙර ඉතිරි රු. 6000/= ක මුදල පරිත්‍යාග කිරීම.
3. සෑම මසක ම රු. 1000/= බැගින් සංගමය වෙත පරිත්‍යාග කිරීම.

ඉහත කී කවර හෝ ක්‍රමයකට අනුව රු. 12000/= මුදල ගෙවා සම්පූර්ණ කිරීමෙන් පසු ඔබගේ එකී අපරිමිත සහයෝගය හා ආශිර්වාදයට උපහාරයක් ලෙසින්, මූලස්ථාන ස්වර්ණ මුද්‍රාවක් සහ සහතික පත්‍රයක් ඔබ වෙත ගෞරව බහුමානයෙන් ප්‍රදානය කරන්නට අධ්‍යක්ෂ මණ්ඩලය බලාපොරොත්තු වේ.

## ව්‍යවහාරික ඡායාරූපකරණය ඩින්ටන් ජයසූරිය නමට.




අප සංගමයේ සභාපතිතුමන් විසින් රචනා කරන ලද ව්‍යවහාරික ඡායාරූපකරණය ග්‍රන්ථය, ජ්‍යෙෂ්ඨතම හා සම්මානනීය සාමාජික, හිටපු විධායක අධ්‍යක්ෂ ඩින්ටන් ජයසූරිය මහතා නමින් පිළිගන්වනු ලැබිණි. පසුගිය අර්ධ වාර්ෂික මහා සභාවේ විශේෂ අංගයක් ලෙසින් මෙම කෘතිය කතුවරයා විසින් ජයසූරිය මහතා ඡායාරූප ශිල්පයට හා සංගමයට සිදුකොට ඇති අපරිමාණ සේවාවට බුහුමන් පිණිස එතුමන් වෙත ප්‍රදානය කෙරිණි.

## සංගමයෙන් ඔබට

2016 සාමාජික ප්‍රවර්ධන වසර අළලා ඔබ වෙනුවෙන් සකස් කරන ලද ප්‍රවර්ධන කට්ටල පරිහරණය කොට ඔබත් අභිමානවත් සාමාජිකත්වයේ ප්‍රතිඵල අත් විඳින්න. එමගින් සංගමයේ ගොඩනැගිලි අරමුදලට යම් සහායක් ලබා දෙන්න.

සංගමයේ ලාංඡනය නම හා යොමුව සහිතව ඔබ වෙත ඉදිරිපත් කෙරෙන මෙම ද්‍රව්‍ය හා ප්‍රවර්ධන කට්ටලය හා ඊට නියමිත පිරිවැය පහත සඳහන් ය.

- **ජෙල් පෑන් යුගලය රු.- 50/=**
- **පිටු 200 Photography My note book - රු.- 100/=**
- **මැට් ලැමිනේෂන් සහිත ෆයිල් කවරය - රු.- 50/=**
- **සංගමයේ නම මුද්‍රිත බෑග් එක - රු.- 100/**
- **60 වන සංවත්සර Felicitation ග්‍රන්ථය - රු.- 1800/=**
- **ටී ෂර්ට් (S, M, L, XL) - රු.- 750/=**
- **කැමරා සඟරා (කලාපයක්) - රු.- 50/=**
- **ඉහත එකතුව ම ලබා ගන්නේ නම් - රු.- 2000/=**
  **(කැමරා සඟරා 05 ක කට්ටලයක් ඇතුළුව)**




ඉරු දිනයන්හි කොළඹ මහාබෝධි විද්‍යාලයට පැමිණීමෙන් මේවා ලබාගත හැකි ය. මේ පිළිබඳ අවශ්‍ය විමසීම් සඳහා තුෂාර සමරකෝන් මහතාගේ 071 4894848 දුරකථන අංකය අමතන්න.

## *HMR වෙත උපහාර පිදෙයි.*

*කීර්තිමත් ශ්‍රී ලාංකේය ඡායාරූප කලාවේදියෙකු වන එච්. එම්. ආර්. පෙරේරා මහතාගේ සමාජ මෙහෙවරට උපහාර පිරිනැමීමක් 2016 ජනවාරි 29 වැනි දින පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයේ දී සිදුවිය. එම විදුහලේ ඡායාරූප සංගමය මගින් සංවිධානය කෙරුණු දම්පල් සේයා 2016 ප්‍රදර්ශනයේ සමාරම්භක උත්සවයේ දී මෙම උපහාරය ඒ මහතාට ගරු විදුහල්පතිතුමන් අතින් පිළිගැන්විණි. සමාරම්භක උත්සවයේ ප්‍රධාන ආරාධිතයා වශයෙන් ද සහභාගි වූ පෙරේරා මහතා වෙනුවෙන් සිදුකළ එකී ගෞරව දැක්වීම පිළිබඳව ධර්මපාල විද්‍යාලයීය ඡායාරූප සංගමයේ උපදේශක නෙරංජන් වික්‍රමාරච්චි මහතා ඇතුළු සංවිධායක කමිටුවට සංගමයේ ස්තුතිය පිරිනැමෙන අතර පෙරේරා මහතාට නිදුක් නිරෝගී චිර ජීවනය ප්‍රාර්ථනා කරමු.*

## ශිෂ්‍ය අත්පොතට අතුලගේ අනුග්‍රහය




2016 වසර සඳහා මුද්‍රණය කළ ශිෂ්‍ය අත්පොතට සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජික, මහනුවර A Pictures ආයතනයේ කළමනාකාර අධ්‍යක්ෂ අතුල ජයසුන්දර මහතා විසින් මුද්‍රණ අනුග්‍රහය දක්වනු ලැබිණි. සංගමයේ සියලු ම පංතිවල පාඨමාලා විද්‍යාර්ථීන් වෙනුවෙන් සිදුකළ මෙම සේවාවට ඒ මහතා වෙත ස්තුතිය පිරිනමමු.

## ඉඳුනිල්ගේ රූපණ අප්‍රේල් 02, 03

රූපණ

EXHIBITION OF PHOTOGRAPHY

නව පරපුරේ ජාත්‍යන්තර සම්මානලාභී ඡායාරූප ශිල්පියෙකු වන ඉඳුනිල් මුණසිංහගේ "රූපණ" ඒක පුද්ගල ඡායාරූප ප්‍රදර්ශනය අප්‍රේල් මස 02, 03 යන දිනවල කොළඹ ජේ.ඩී.ඒ. පෙරේරා කලාගාරයේ දී පැවැත්වීමට විධිවිධාන යොදා තිබේ. අප සංගමයේ ANPAS සම්මානලාභියෙකු මෙන් ම ජාත්‍යන්තර ඡායාරූප කලා සම්මේලනයේ AFIAP සම්මානයෙන් පිදුම් ලැබූවෙකු ද වන ඔහු පස් වසරක් පුරාවට ජාතික හා ජාත්‍යන්තර සම්මානයෙන් පිදුම්ලත් සිය නිර්මාණ 45 ක් මෙම ප්‍රදර්ශනය සඳහා සූදානම් කර ඇත. ප්‍රදර්ශනය සඳහා ඔබ සැමගේ පැමිණීම අපේක්ෂා කරන අතර, ඉඳුනිල් මුණසිංහට සංගමයේ සුබපැතුම් පිරිනමමු.

## සංස්කෘතික දෙපාර්තමේන්තුව ඡායාරූප ශිල්පයට අතදෙයි.

සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ අනූෂා ගෝකුල ප්‍රනාන්දු මහත්මියගේ මගපෙන්වීම පරිදි අනිකුත් කලා මාධ්‍ය මෙන් ම ඡායාරූප කලාවේ ප්‍රවර්ධනය සඳහා නව දෙනෙකුගෙන් සමන්විත උපදේශක සභාවක් පත්කොට තිබේ. එහි කාර්යයන් දියත් කරලීම පිණිස උත්සව සංවිධාන, ප්‍රදර්ශන, ප්‍රකාශන, සම්මන්ත්‍රණ හා මාධ්‍ය වශයෙන් ක්‍රියාකාරී කමිටු 05 ක් පත් කොට ඇත.

ඉදිරි අගෝස්තු 19 දිනට යෙදෙන ලෝක ඡායාරූප දිනය සමරනු වස් වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කරලීමට දෙපාර්තමේන්තුව බලාපොරොත්තු වේ. ඉන් ප්‍රධානතම ප්‍රකාශන කාර්යයන් ලෙස ඡායාරූප ශිල්ප ශාස්ත්‍රීය සංග්‍රහයක් පළකිරීම. පසුගිය රාජ්‍ය ඡායාරූප කලා අනුමණ්ඩලය මගින් සම්පාදිත ආචාරධර්ම සංග්‍රහය නිකුත් කිරීම, ඡායාරූප ශිල්ප වාග්මාලාවක් සම්පාදනය, ඡායාරූප ශිල්පීන්ගේ නාමාවලියක් සකස් කිරීම යන කටයුතු දැනටමත් ආරම්භ කොට ඇත.

මෙම ඡායාරූප ශිල්ප තොරතුරු එකතුවට ඔබගේ විස්තර ද ඇතුළත් කිරීම සඳහා පහත සඳහන් කූපනය පුරවා අධ්‍යක්ෂ, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 08 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල යන ලිපිනයට යොමු කරන්න.

## Photographer's Directory

Name in full : ..............................................................................................................

Postal address : ..............................................................................................................

Tel. No. : ..............................................................................................................

E-mail : ..............................................................................................................

Specialized Field: (Please tick)

| Academic | Commercial | Fashion | Freelance | News | Sports | Studio | Wedding | Wildlife | Other (Specify) |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

### ඔබේ තොරතුරු පිළිසඳරට එවන්න

ඔබේ ඡායාරූප ශිල්ප මෙන් ම වෙනත් ජයග්‍රහණ, ජීවිතයේ වැදගත් අවස්ථා ඇත්නම් සියලු අත්දැකීම් සමස්ත සාමාජිකත්වයත් සමග බෙදා හදා ගන්න. ඔබේ තොරතුරු පිළිසඳරට යොමු කරන්න.

**ගරු ප්‍රකාශන අධ්‍යක්ෂ,**

**ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය,**

**170, කොළොන්නාව පාර, දෙමටගොඩ,**

**කොළඹ 09.**

### පාසල් ඡායාරූප ශිල්ප පරීක්ෂණයේ ප්‍රතිඵල නිකුත් වේ.

අප සංගමය මගින් ඉදිරිපත් කොට ඇති විෂය නිර්දේශය පරිදි ඡායාරූප පංති පැවැත්වෙන පාසල්වල දරුවන් සඳහා වන පරීක්ෂණයේ ප්‍රතිඵල දැන් නිකුත් කොට තිබේ. මෙම ප්‍රතිඵල ඉදිරි දින කිහිපය තුළ ඒ ඒ පාසල්වලට දැනුම්දීමට පියවර ගැනේ. විභාග ලේඛකාධිකාරි උපනන්ද සෙනෙවිරත්න මහතාගේ මෙහෙයවීම පරිදි මෙම පරීක්ෂණය පසුගිය දෙසැම්බර් 05 වැනි දින කොළඹ නාලන්දා විද්‍යාලයේ දී පැවැත්විණි.

# ජ්‍යෙෂ්ඨයින් වෙතටයි.....

## එන්න, ඔබ ඇවිත් යන්න එන්න.....

සංගමය සක්‍රීය යි. සාමාජිකත්වය අවදියෙන්. ඒත් ඇතැම් ජ්‍යෙෂ්ඨ සාමාජික හවතුන්ට සංගමය අමතක වෙමින් තිබෙනවා දැයි කුකුසක් පැනනැගේ. ඒ නිසා ම ඉඩ ලැබෙන එක ම එක දවසක හෝ සංගමය වෙත ඇවිත් යන්න එන්න. අප ඉන්නේ ඔබ බලාපොරොත්තුවෙන්.

- කණිෂ්ඨ / නවක සාමාජික පිරිස -

ඡායාරූප පංති : පෙබ. 21, 28, මාර්තු 06, 13, 27 අප්‍රේල් 03

වාර්ෂික දෙදින චාරිකාව : මාර්තු 19/20

සාමාජික සුහද හමුව : අප්‍රේල් 24

### අනුග්‍රාහක දැන්වීමකින් පිළිසඳරට සහාය

*ද්වි මාසිකව නිකුත් කෙරෙන පිළිසඳර සඳහා අනුග්‍රාහක දැන්වීමක් සපයාදීමට ඔබට හැකි නම් එය මහත් අත්වාරුවකි. මේ ගැන හොඳින් සිතා බලා හැකියාවක් වෙතොත් අමතන්න. ප්‍රදීප් (072 3230329) උදිත (071 8106680)*

### අතුල රණරාජගේ PIXALE.lk

ජ්‍යෙෂ්ඨ සාමාජික අතුල රණරාජ මහතා අන්තර්ජාලය තුළ ඡායාරූප ශිල්පයට අදාළ න්‍යායාත්මක හා ව්‍යවහාරාත්මක සාකච්ඡා මණ්ඩපයක් ආරම්භ කොට ඇත.

පික්සලී.lk ලෙස නම් කොට ඇති මෙම අන්තර්ජාල පිළිසඳරට එක්වීමෙන් ඔබට ද ඔබේ අත්දැකීම් සහෘදයන් සමග හුවමාරු කරගන්නට අවකාශ ලැබෙනු ඇත.

# ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය
# The National Photographic Art Society of Sri Lanka

## ඡායාරූප පාඨමාලා විද්‍යාර්ථීන් සඳහා වන
## මාසික ඡායාරූප තරග නිර්ණායක

### අරමුණ
සංගමයේ ඡායාරූප පංතිවල අධ්‍යාපනය ලබන විද්‍යාර්ථීන්ගේ නිර්මාණාත්මක හැකියාව සහ රසවින්දනය වැඩිදියුණු කරලීම අරබයා මාසික ව සංවිධානය කෙරේ. ජාතික හා ජාත්‍යන්තර තරග සහ ප්‍රදර්ශන සඳහා නිර්මාණකරුවන් දිරිගැන්වීම ද මෙමගින් අපේක්ෂිත ය.

### තේමාව
අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ අනුමැතිය පරිදි විශේෂිත තේමාවක් තෝරාගන්නා අවස්ථා හැර, අන් සෑම ඡායාරූප තරගයක් ම විවෘත තේමා යටතේ පැවැත්වේ.

### නිර්මාණ ඉදිරිපත් කිරීම
සංගමයේ ඡායාරූප පංතිවල අධ්‍යාපනය ලබන අයට පමණක් සීමා වේ.

### ඡායාරූප ඉදිරිපත් කිරීමේ නිර්ණායක
- මීට පෙරාතුව වෙනත් ඡායාරූප දැක්මක ප්‍රදර්ශිත හෝ කලින් මාසික තරගවලට ඉදිරිපත් කළ ඡායාරූප මේ සඳහා භාර නොගැනේ.
- එක් අයෙකුට අභිමත නිර්මාණ සංඛ්‍යාවක් ඉදිරිපත් කළ හැකි ය.
- අධ්‍යයන වර්ෂයේ පළමු මාසික තරගය පමණක් පහත සඳහන් අංශ යටතේ පැවැත්වේ.

  ප්‍රථම වසර වර්ණ - විශාලත්වය 4" x 6" සිට ඉහළට.

  ප්‍රථම වසර ඒකවර්ණ<br>
  දෙවන වසර ඒකවර්ණ<br>
  දෙවන වසර වර්ණ<br>
  තෙවන වසර ඒකවර්ණ<br>
  තෙවන වසර වර්ණ<br>
  } විශාලත්වය 6" x 9" සිට ඉහළට.

- අධ්‍යයන වර්ෂයේ දෙවන මාසික තරගයේ පටන් අවසානය දක්වා පහත සඳහන් අංශ යටතේ පැවැත්වේ.

  ප්‍රථම වසර ඒකවර්ණ<br>
  ප්‍රථම වසර වර්ණ<br>
  දෙවන වසර ඒකවර්ණ<br>
  දෙවන වසර වර්ණ<br>
  තෙවන වසර ඒකවර්ණ<br>
  තෙවන වසර වර්ණ<br>
  } විශාලත්වය 6" x 9" සිට ඉහළට

### කෘති ඇගයීම
අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ අනුමැතිය ඇතිව මාසික ඡායාරූප තරග සංවිධායක විසින් පත්කරනු ලබන තේරීම් කමිටුවක පොදු එකඟතාව මත කෘති තෝරාගත යුතු ය. කෘති ඇගයීමේ නිර්ණායක තරග සංවිධායකවරයාගේ අභිමතය හා තේරීම් කමිටුවේ එකඟතාව පරිදි සිදුකළ හැකි නමුදු, ඡායාරූප සම්බන්ධ විවෘත සංවාදයේ දී ඒ පිළිබඳ කරුණු සහාගත කළ යුතු ය.

නිර්මාණකරුවන් දිරිගැන්වීම සඳහා සෑම තරග අංශයක ම ප්‍රමුඛතා ලබන ජයග්‍රාහකයාට කිසියම් හෝ තිළිණයක් ප්‍රදානය කළ යුතු ය. එක් අධ්‍යයන වර්ෂයක් තුළ තරගවල ඉහළ ම ප්‍රමුඛතා ලබාගන්නා නිර්මාණකරුවාට වර්ෂාවසානයේ ඒ සඳහා නියමිත ශූරතා පළිහ පිරිනැමීමට කටයුතු සංවිධානය කිරීම මාසික තරග සංවිධායකවරයාගේ වගකීම වේ.

### මාසික තරග සංවිධායක තනතුර
අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව සංගමයේ අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් කිසියම් නිල වර්ෂයකට හෝ අධ්‍යයන වර්ෂයකට අදාළ ව මාසික තරග සංවිධායක පත්කරනු ලබයි. එසේ පත්කරනු ලැබූ තරග සංවිධායකවරයා හෝ සංවිධායකවරිය අධ්‍යක්ෂ මණ්ඩලයට වගකිවයුතු වන්නේ ය. පත්කරගනු ලැබූ මාසික තරග සංවිධායකවරයා හෝ සංවිධායකවරිගේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත් නොවන්නේ නම්, ඕනෑ ම මොහොතක එකී තනතුරට අනෙකෙකු පත් කළ හැකි ය.

මාසික ඡායාරූප තරග සංවිධායකවරයාගේ කාර්ය පහසුව හා ඡායාරූප විචාර සැසිය සංවිධානය පිණිස මාසික ඡායාරූප තරග සංවිධායක මණ්ඩලයක් පත්කරනු ලැබිය හැකි ය. එහි සාමාජික සංඛ්‍යාව නිශ්චිත ගණනකට සීමා නොවන අතර, එම පුද්ගලයින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට යටත්ව අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් පත්කරනු ඇත.

## අනුග්‍රහයට උපහාරය




2015 වසරේ සංගමය විසින් සිදුකරන ලද විවිධ ශාස්ත්‍රීය, සුබසාධන, අධ්‍යයන හා සමාජීය කාර්යයන් සඳහා ආධාර අනුග්‍රහය සපයන ලද ආයතන අතුරින් ප්‍රධාන දායකත්වයක් හෙබවූ ආයතන 03 ක් වෙත පසුගිය අර්ධ වාර්ෂික මහා සභාවේ දී තිළිණ ප්‍රදානයක් සිදු කෙරිණි. එහි දී මෙට්‍රොපොලිටන් කැනන් ෆොටෝහබ්හි සාමාන්‍යාධිකාරී සුරේෂ් හේරත්, කැමරා එල් කේ ආයතනයේ කළමනාකාර අධ්‍යක්ෂ අනුෂ්ක ගුණසිංහ, යන මහත්වරුනට කෘතවේදී සම්මාන පිරිනැමුණු අතර ලීෆ් ආයතනයේ අධ්‍යක්ෂ නිරූන් බුද්ධසිරි මහතාගේ නොපැමිණීම හේතුවෙන් එම තිළිණය එතුමන් වෙත යොමු කෙරිණි.

එසේ ප්‍රධාන අනුග්‍රාහකත්වයකින් තොරව වුවත් නන්විධ ආකාරයන්ගෙන් සංගමයේ කාර්යයන්ට උදව් කළ, අතහිත දුන් හා ආශීර්වාද කළ සියලු ව්‍යාපාරික හා සමාජ ආයතනවලට මේ මොහොතේ සංගමයේ ගෞරවය පිරිනැමේ.

## අලුත් අවුරුදු සතුට එක්සිත්ව බෙදාගනිමු.

සංගමයේ සාමාජික සැමදෙනා එක්ව අප්‍රේල් මාසයට යෙදෙන සිංහල හා හින්දු අලුත් අවුරුද්ද සැමරීමට විශේෂ වැඩසටහනක් සම්පාදනය කිරීමට සමාජසේවා හා සුබසාධන අංශය අපේක්ෂා කරයි. සාමාජික සාමාජිකාවන් සේ ම ඔවුන්ගේ පවුල්වල සාමාජිකයිනට ද මේ සඳහා ඇරයුම් කෙරේ. සාමාජික බක්මහ උළෙල අප්‍රේල් මස 24 වැනි ඉරුදින කොළඹ 02, පෙරහැර මාවතේ ස්ටැන්ලි ජැන්ස් ක්‍රීඩාංගනයේ දී පැවැත්වීමට කටයුතු සැලසුම් කර ඇත. ඉදිරි පිළිසඳරකින් වැඩි විස්තර දැනුම්දෙන අතර දැනට මේ මතක් කිරීම, දිනය වෙන්කොට තබා ගැනීම සඳහා ය. මේ සඳහා ඔබේ සහය සහ ශක්තිය එක් කරලන්නටත්, වැඩිදුර තොරතුරු සඳහාත් සමාජසේවා හා සුබසාධන අධ්‍යක්ෂ අනුර රාජා සිංහබාහු (0718592308) අමතන්න.

## අපේ ශෝකය

- සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකාවක වන සුනේත්‍රා චන්ද්‍රකාන්ති මහත්මියගේ දයාබර පියාණන් පසුගිය දා අභාවප්‍රාප්ත විය ඒ පිළිබඳ සංගමයේ බලවත් කණගාටුව පළකරමු.
- හිටපු අධ්‍යාපන අධ්‍යක්ෂ, ජ්‍යෙෂ්ඨ සාමාජික සමන් කුලසූරිය මහතාගේ දයාබර පියාණන් රෝගාතුරව සිට අභාවයට පත් විය. කුලසූරිය පවුල වෙත අපගේ සංවේගය පිරිනමමු.
- සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජික කුරුණෑගල සිරිසර වර්ණ රසායනාගාරයේ අධිපති ජගත් ද සිල්වා මහතාගේ ආදරණීය මෑණියන් අභාවප්‍රාප්ත විය. ඒ පිළිබඳ සංගමයේ ශෝකය ප්‍රකාශ කරමු.

# නවකයින්ට විශේෂයි

ලංකා කැමරා
Lanka Camera
www.lankacamera.com

සංගමය විසින් පසුගිය කාලයේ ප්‍රකාශයට පත්කළ ලංකා කැමරා සඟරාවේ ඡායාරූප ශිල්පීන්ට හා විද්‍යාර්ථීන්ට බෙහෙවින් වැදගත් වන පාඩම් මාලා හා ශාස්ත්‍රීය මෙන් ම ව්‍යවහාරික කරුණු ද අඩංගු වේ. මේවා පරිශීලනය, විෂයයක් වශයෙන් ඡායාරූප ශිල්පය හදාරන ඔබට බොහෝ සෙයින් පලදායි වනු ඇත. එබැවින් ලංකා කැමරා පිටපත් කීපයක් බැගින් මෙවර සංගමයට අලුතින් පැමිණි ඔබගේ සාමාජික ප්‍රවර්ධන කට්ටලයට ඇතුළත් කරන ලදී. එහෙත් ඊට අතිරේක වශයෙන් ඉතිරිව ඇති සීමිත ලංකා කැමරා කලාප කිහිපයක් රු 50/= ක සහනදායි ගාස්තුවකට ලබාගැනීමට ඔබට හැකියාව ඇත. මහාබෝධි විදුහලේ පැවැත්වෙන ඉදිරි ඡායාරූප පංතිවල දී ඒවා ඔබට ලබා ගත හැකි ය.

## කාල සටහනට වැඩ කරමු.

*2016 අධ්‍යයන වර්ෂය සඳහා ප්‍රථම, දෙවන, ඩිප්ලෝමා වසරවල පංති කාලසටහන් මේ වන විට අදාළ විද්‍යාර්ථීන් වෙත නිකුත් කොට තිබේ. ඔවුන් අත්‍යවශයෙන් ම සහභාගි විය යුතු පංති කාමර දේශන, ප්‍රායෝගික පංති හා සංගමයේ අනිකුත් අධ්‍යයන හා පොදු කාර්යයන් එහි සඳහන් ය. අදාළ කාලසටහනට අනුව නියමිත වේලාවන්ට එම කටයුතුවලට සහභාගි වීමෙන් සංගමයට සහය වන ලෙසත්, එම කාර්යයන්ගේ උපරිම පලදාව නෙලාගන්නා ලෙසත් මෙයින් සිහිපත් කරමු.*

## CROWN 2 සම්මානය ඉඳුනිල්ට

UPI (United Photographers International) වශයෙන් හඳුන්වනු ලැබූ ආයතනය, GPU (Global Photographic Union) ලෙස වෙනස් කරලීමෙන් පසු, ලොව පුරා ඡායාරූප ශිල්පීන්ගේ නිර්මාණාත්මක දක්ෂතා අගයමින් සම්මාන ප්‍රදානයක් පුළුල්ව සිදුකරන්නට පියවර ගෙන තිබේ. ප්‍රංශය මූලස්ථානය කොටගෙන ක්‍රියාත්මක වන මෙම සංවිධානය රටවල් 10 ක සංවිධාන ව්‍යුහයකින් යුක්ත වේ. මෙම සංවිධානයෙන් පිරිනැමෙන සම්මාන අතර වන CROWN 2 සම්මානය කීර්තිමත් ඡායාරූප කලාවේදී ඉඳුනිල් මුණසිංහ මහතා විසින් දිනාගෙන ඇත. මෙම ජයග්‍රහණයත් සමගින් ඉඳුනිල් මුණසිංහ මහතා CROWN 2 සම්මානයෙන් පිදුම්ලත් පළමු ශ්‍රී ලාංකිකයා බවට පත් වෙයි.

### පිළිසඳරට වෙහෙස මහන්සිය

ප්‍රකාශන අධ්‍යක්ෂ - ප්‍රදීප් වෙදමේස්ත්‍රිගේ

පිළිසඳර - ප්‍රකාශන අනු කමිටුව

1 වසර - මදූෂිකා ලක්මාලි මෙය
ආර්. එම්. මඩවල මහතා

2 වසර - සී. එස්. දන්තනාරායන මහතා

3 වසර - රුසිරු තරංග පෙරේරා මහතා

# ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය
# The National Photographic Art Society of Sri Lanka

## ඩිප්ලෝමා පාඨමාලාවේ අවසන් පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරනු ලබන නිබන්ධනය සම්බන්ධයෙන් විභාග අපේක්ෂකයින් අනුගමනය කළ යුතු උපදෙස්.

### මාතෘකාව තෝරාගැනීම සහ සංස්කරණය

- සියලු ම නිබන්ධන සම්පාදකයින් අදාළ නිබන්ධන මාතෘකාව තෝරාගැනීම, සුදුසු ආකාරයට සංශෝධනය කිරීම සහ නිබන්ධනයේ ප්‍රධාන අංශ මෙන් ම අනු අංශ පිළිබඳ අවසන් තීරණ ගැනීම සම්බන්ධයෙන් නිබන්ධන උපදේශකවරයාගේ උපදෙස් පිළිපැදිය යුතු වන අතර අවසන් වශයෙන් තීරණය වූ මාතෘකාව ලිඛිතව සංගමය වෙත භාර දිය යුතු වේ. නිබන්ධන සඳහා ඉදිරිපත් වන අපේක්ෂකයින් ගරු ලේඛකාධිකාරීවරයා වෙතින් අදාළ ආකෘති පත්‍රය ලබාගෙන නිසි පරිදි පුරවා නියමිත දිනට සිය පංති භාර ආචාර්යවරයා හෝ නිබන්ධන කටයුතු භාර ආචාර්යවරයා වෙත භාරදිය යුතු ය.
- එකී නිබන්ධන යෝජනාව අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් පත් කරනු ලබන කමිටුවකින් සංශෝධන සහිතව හෝ රහිතව අනුමත කිරීමෙන් පසු නියමිත අධ්‍යයන කාර්යයට අවසරය ලැබෙනු ඇත.
- සියලු ම නිබන්ධන සම්පාදකයින් ආරම්භයේ පටන් නිබන්ධනය අවසානය වන තෙක් නිබන්ධන උපදේශකවරයාගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

### නිබන්ධනය වශයෙන් තෝරාගත හැකි ඉදිරිපත් කිරීම්

- ඡායාරූපකරණයට හෝ පොදුවේ ප්‍රතිබිම්බ මූලික කලාවන්ට, එනම් රූපවාහිනී තාක්ෂණයට, වීඩියෝකරණයට, සිනමාවට අදාළත්වයක් ඇතැයි පිළිගත හැකි තෝරාගනු ලබන මාතෘකාවක් මත පර්යේෂණාත්මක හෝ ගවේෂණාත්මක ලිඛිත නිබන්ධනයක්. නිබන්ධනය වචන 4000 කට නොඅඩු හා වචන 7000 ක් නොඉක්මවන්නක් විය යුතු ය. (තෝරාගන්නා ලද විෂය හා මාතෘකාව මත හෝ නිබන්ධන උපදේශකවරයාගේ නිර්දේශයට යටත් ව ඉහත සීමාව වෙනස් වන්නට පුළුවන). ලිඛිත නිබන්ධනයේ පිටු සැකැසුම මෙම චක්‍රලේඛයේ මුල් පිටපතෙහි දක්වෙන උපදෙස් පරිදි සිදුකළ යුතු ය.
- විනාඩි 20 ක උපරිම කාල සීමාවකට යටත් ව වෘත්තාන්තමය හෝ වාර්තාමය වීඩියෝ නිෂ්පාදනයක්.
- සංගමයේ ඡායාරූප පාඨමාලා විෂය නිර්දේශයෙහි පාඩම් මාතෘකාවකට අනුව සම්පාදනය කරන ලද ඉගෙනුම් ආධාරක ශ්‍රව්‍ය දෘශ්‍ය වැඩසටහනක්. (Audio Visual Multimedia Presentation) මෙහි කාල සීමාව විනාඩි 20 සිට 60 අතර දක්වා විය හැකි ය.
- ඉහත සඳහන් කිසියම් එක් ආකාරයකට සකසන ලද නිබන්ධනය නියමිත දිනට හෝ ඊට ප්‍රථම පිටපත් දෙකකින් ලේඛකාධිකාරී (විභාග) වෙත භාර දිය යුතු ය.

සෑම අපේක්ෂකයකු විසින් ම තමා ඉදිරිපත් කරන ලද නිබන්ධනය පිළිබඳව වාචික කරුණු ඉදිරිපත් කිරීමක් සිදුකළ යුතු අතර එහි දී උචිත ඉදිරිපත් කිරීමේ උපක්‍රම හා උපාංග භාවිත කළ යුතු ය. මේ සියලු ඉදිරිපත් කිරීම් ඩිප්ලෝමා පරීක්ෂණය සඳහා ම සම්පාදනය කරන ලද ඒවා විය යුතු ය.

### ඩිප්ලෝමා පරීක්ෂණයට අදාළ නිබන්ධනය පිළිබඳ (වාචික) ඉදිරිපත් කිරීම

**(කාලය විනාඩි 15)**

**ඉදිරිපත් කිරීමේ අනුපිළිවෙළ**

- පරීක්ෂක මණ්ඩලය ඉදිරියට පැමිණීම (තත්. 20)
- ආශිංසනය හා ආමන්ත්‍රණය (තත්. 10)
- ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාව පැහැදිලි කිරීම (විනාඩි 1)
- අරමුණ පැහැදිලි කිරීම සහ විෂය පරාසය පැහැදිලි කිරීම (විනාඩි 1)
- අදාළ විෂය කරුණු එකින් එක ඉදිරිපත් කිරීම (විනාඩි 8)
- ඉදිරිපත් කළ කරුණු සාරාංශ කර දැක්වීම (විනාඩි 1)
- ගැටලු ඉදිරිපත් කිරීමට ආරාධනා කිරීම } (විනාඩි 3)
- ගැටලු සඳහා පිළිතුරු සැපයීම }
- නිම කිරීම සහ ස්තුති කිරීම. (තත්. 30)

### සැලකිය යුතු කරුණු

- සිටගැනීම (ඉදිරිපත් කිරීම සිදුකරන කාලය තුළ නිවැරදි ඉරියව් පැවැත්වීම)
- සෑම විට ම පරීක්ෂක මණ්ඩලය දෙසට මුහුණලා සිටීම සහ ඇස් යොමු කිරීම
- ශබ්ද නගා කතාකිරීම
- දෑත් පරිහරණය හා අදහස් ප්‍රකාශනය
- සුදුසු පරිදි ඉදිරිපත් කිරීමේ නිදර්ශන, ආකෘති, උපාංග සහ උපකරණ භාවිතය. (Examples, Miniatures, Slides/ Transparencies, Show Cards, Video, Multi Media)
- ගැටලු සඳහා පිළිතුරු සැපයීමේ දී අදාළ විමසුමට ම ඉලක්කගතව තාර්කික පිළිතුරු ඉදිරිපත් කිරීම.